# ගණිතය

## පළමුවන ශ්‍රේණිය

### තුන්වන වාරය

<u>ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි</u>

**සැකසුම : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**



# පරිසරයේ වෙනස්කම් ඇසුරින් කාලය හඳුනාගැනීම





**සපයා ගත යුතු දේ -**

- උදය ,දවල්,රාත්‍රිය දැක්වෙන පින්තූර
- ඒවා නැතිනම් ගණිතය වැඩ පොතේ පිටු අංක 76හි ඇති පින්තූර.

**දෙමාපියන්ට උපදෙස් -**

- දරුවා සමග මේ ගීතය ගායනා කරන්න.

උදේම ඉර පායනවා - ලස්සන මල් පිපෙනවා

දත් මැද මුව සෝදාලා - අපි හැම පාසල් යනවා

ටික ටික දහවල් වෙනවා - අව්ව සැරට පායනවා

පාසල නිමවී අපි සැම - දවල්ට ගෙදරට එනවා

ඉර බැස ගොස් කළුවර වී - ටික ටික රෑ බෝ වෙනවා

වැඩ ඇරිලා ටොෆි අරගෙන - තාත්ත ගෙදරට එනවා

- උදෑසන දරුවා සමග මිදුලට ගොස් පරිසරයේ දැකිය හැකි දේ ගැන කතා කරන්න.
    - ඉර පායාගෙන එනවා
    - ගස්වල මල් පිපෙනවා
    - පාරේ මිනිස්සු වැඩට යනවා
    - කුරුල්ලෝ කූඩුවලින් එළියට ඇවිල්ලා කෑම සොයා යනවා ආදී ලෙස
    - කුරුල්ලන්ගේ ශබ්දවලට සවන්දීමට කියන්න.
- මේවා සැම උදෑසනක ම දකින්නට පුළුවන් බව කියා දෙන්න. සපයාගත් උදෑසන පින්තූරයේ ඇති දේ පිළිබඳ දරුවා සමග කතා කරන්න. උදය කාලයේ දුටු දේ චිත්‍රයට නගන්න.

**ක්‍රියාකාරකම 02 -**

**දෙමාපියන්ට උපදෙස් -**

- දහවල් කාලයේ පරිසරයේ දකින දේවල් හා ඇඟට දැනෙන රස්නය පිළිබඳ දරුවා සමඟ කතා කරන්න.
- ඉර අපගේ හිසට ඉහළින් අහසේ මුදුනට ඇවිත් බව පවසන්න.
- පාරේ යන අය අව්ව නිසා කුඩ ඉහලාගෙන යන ආකාරය පෙන්වන්න.
- පාසල නිම වෙන්නේ මේ වෙලාවට බව කියාදෙන්න.
- සපයා ගත් පින්තූරය පෙන්වා එහි පෙනෙන දේ කතා කරන්න.
- දහවල් කාලයේ පෙනෙන දේ චිත්‍රයක් ඇඳීමට කියන්න.

**ක්‍රියාකාරකම 03 -**

**දෙමාපියන්ට උපදෙස් -**

- රාත්‍රී කාලයේ දරුවා සමඟ මිදුලට යන්න.
- අවට පරිසරයේ දකින දේ පිළිබඳ කතා කරන්න.
- ඉර බැස ගොස් අඳුරු වී ඇති ආකාරය පෙන්වන්න.
- අහසේ හඳ, තරු, පායා ඇති ආකාරය පෙන්වන්න
- රෑට අහසේ පියාඹන කුරුල්ලන් සිටී නම් පෙන්වන්න.
- රාත්‍රී කාලයේ පින්තූර පෙන්වා ඒවායේ පෙනෙන දේ ගැන කතා කරන්න.
- "රාත්‍රී කාලය" චිත්‍රයක් ඇඳීමට යොමු කරන්න.